## කොළඹ මහා නගර සභාව

### පුරප්පාඩු තනතුරු සඳහා විවෘත බඳවා ගැනීම - 2026

පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි පහත සුදුසුකම් සපුරා ඇති පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

❖ **පොදු සුදුසුකම් :-**

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම.

II. අයදුම්පත් කැඳවන අවසාන දිනට (2026.08.10) පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

III. යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

IV. තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

V. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට (2026.08.10) සෑම ආකාරයකින්ම සපුරා තිබිය යුතුය.

**01. <u>බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල ප්‍රාථමික - ශිල්පීය නොවන සේවා ගණයේ පහත දක්වා ඇති III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම.</u>**

- වැටුප් ක්‍රමය :- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව PL 1 – 2025 (I වන වැටුප් පියවර ආරම්භක වැටුප වේ)

40,000 – 10 x 450 – 10 x 490 – 10 x 540 – 12 x 590 – 61,880/-

(වැටුප් ගෙවනු ලබන්නේ උපලේඛන III හි සඳහන් පරිදි වේ.)

| තනතුරු නාමය | වයස් සීමාව | අධ්‍යාපන සුදුසුකම් | බඳවා ගන්නා ක්‍රමය | විභාග ගාස්තු |
|---|---|---|---|---|
| • කාර්යාල සේවක සේවයේ (කාර්යාල කාර්ය සහයක) | අවුරුදු 18-45 | අ.පො.ස(සා.පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙන් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් (06) සමත් වී තිබීම. මින් විෂයන් පහක් (05) එකවර සමත් විය යුතුය. | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය | අදාළ නොවේ. |
| • වැඩ / ක්ෂේත්‍ර කම්කරු | අවුරුදු 18-45 | 08 ශ්‍රේණිය (09 වසර) සමත් විය යුතුය. | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය | අදාළ නොවේ. |



Scanned with CamScanner

| | | | | |
|---|---|---|---|---|
| • ගස්කපන්නා<br>• උපස්ථායක<br>• සුසානභූමි භාරකරු<br>• රසායනාගාර සේවක (සහයක)<br>• බල්ලන් අල්ලන්නා<br>• ක්ෂේත්‍ර කාර්යය සහයක | අවුරුදු 18-45 | අ.පො.ස (සා.පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදි යටත් පිරිසෙන් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් (06) සමත් වී තිබිම. මින් විෂයන් පහක් (05) එකවර සමත් විය යුතුය. | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය | අදාළ නොවේ. |

02. <u>බස්නාහිර පළාතේ පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ-02 සේවා ගණයේ ක්‍රීඩා උපදේශක III ශ්‍රේණියේ තනතුර</u>

- වැටුප් ක්‍රමය :- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව MN 1 – 2025 (I වන වැටුප් පියවර ආරම්භක වැටුප වේ.)

45 230– 10 x 540 – 11 x 630 – 10 x 890 – 10 x 1190 - 78360/-

(වැටුප් ගෙවනු ලබන්නේ උපලේඛන III හි සඳහන් පරිදි වේ.)

| තනතුර | වයස | අධ්‍යාපන සුදුසුකම් | වෘත්තිය සුදුසුකම් | පළපුරුද්ද | බඳවා ගන්නා ක්‍රමය | විභාග ගාස්තු |
|---|---|---|---|---|---|---|
| ක්‍රීඩා උපදේශක | අවුරුදු 18-25 | අ.පො.ස.(සා/පෙළ) විභාගයේ දී සිංහල /දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හයක් (06) සමත් වී තිබීම සහ අ.පො.ස. (උ/පෙළ) විභාගයේ දී සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර අවම වශයෙන් එක් විෂයක්වත් සමත් වී තිබීම. | රජයේ පිළිගත් ආයතනයක ක්‍රීඩා කළමනාකරණය / ක්‍රීඩාංගන හා නඩත්තුව පිළිබඳ අවම වශයෙන් මාස 06 ක පාඨමාලාවක් සාර්ථකව හදාරා තිබීම සහ ජාත්‍යන්තර හෝ ජාතික ක්‍රීඩා පුහුණුකරු / ක්‍රීඩා තරග විනිසුරු පාඨමාලාවක් හදාරා තිබීම හෝ ජාත්‍යන්තර හෝ ජාතික පුහුණුකරු / තරග විනිසුරු වශයෙන් කටයුතු කර තිබීම හෝ ජාතික මට්ටමේ හෝ පළමු පෙළ ක්‍රීඩා තරග සඳහා කේවල / කණ්ඩායම නියෝජනය කර තිබීම. | පාසල් මට්ටමේ හෝ ක්‍රීඩා සමාජ මට්ටමේ පුහුණුකරුවෙකු ලෙස අවම වශයෙන් වසර 02 ක පළපුරුද්දක් ලබා තිබීම. | ලිඛිත පරීක්ෂණයෙන් සමත් අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට භාජනය කර ලිඛිත විභාගයේ සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු වල එකතුවේ කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ. | රු. 500/ (ගෙවිය යුතු ආකාරය අයදුම්ප දක්වා ඇත.) |



Scanned with CamScanner

❖ විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය | කාලය |
|---|---|---|
| මූලික ක්‍රීඩා දැනුම | ජාතික ක්‍රීඩා / විවිධ ක්‍රීඩා පිළිබඳ තාක්ෂණික දැනුම හා ක්‍රීඩා නීති රීති පිළිබඳ දැනුම පරීක්ෂා කිරීමේ ප්‍රශ්න පත්‍රයකි. | පැය 02 |
| අභියෝග්‍යතාවය | තර්කන ශක්තිය, ගණිත කුසලතාවයන්, ක්ෂණික තීරණ ගැනීමේ හා කාලය කළමනාකරණය කිරීම පිළිබඳ ඇගයීමේ ප්‍රශ්න පත්‍රයකි. | පැය 01 |

**<u>03. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ මෝටර් රථ රියදුරු III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම.</u>**

- වැටුප් ක්‍රමය :- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව PL 3 – 2025 (I වන වැටුප් පියවර ආරම්භක වැටුප වේ.)

42 780– 10 x 490 – 10 x 540 – 10 x 590 – 12 x 630 - 66540/-

(වැටුප් ගෙවනු ලබන්නේ උපලේඛන III හි සඳහන් පරිදි වේ.)

| තනතුර | වයස | අධ්‍යාපන සුදුසුකම් | පළපුරුද්ද | කායික සුදුසුකම් | බඳවා ගන්නා ක්‍රමය | විභාග ගාස්තු |
|---|---|---|---|---|---|---|
| මෝටර් රථ රියදුරු | අවුරුදු 18-45 (දැනටමත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ යෙදී සිටින ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පත්වීම්ලාභීන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.) | අ.පො.ස.(සා/පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සිංහල / දෙමළ භාෂාව ඇතුළුව සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයන් හයක් (06) සමත් වී තිබීම. (එක් වරක දී විෂයන් පහක් (05) අවම වශයෙන් සමත් ව තිබිය යුතුය.) | බලපත්‍රය ලැබීමෙන් පසු රියදුරෙකු ලෙස අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් තිබිය යුතුය. (පළපුරුද්ද විධිමත් සහතිකයක් මගින් සනාථ කළ යුතුය.) | i. අවම උස අඩි පහක් (5') විය යුතුය.<br>ii. දිවා කාලයේ හා රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු යෝග්‍ය තත්ත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය. (රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් මගින් ඒ බැව් සනාථ කළ යුතුය.) | වෘත්තීය පරීක්ෂණයක් හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින්<br><u>වෘත්තීය පරීක්ෂණය</u><br>i. රිය පැදවීමේ නිපුණත්වය<br>ii. මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම<br>iii. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | අදාළ නොවේ. |

**<u>වෘත්තීය සුදුසුකම් :-</u>**

- සැහැල්ලු වාහන රියදුරු තනතුර සඳහා -

  i. පෞද්ගලික / කුලී රථ සහ තාර බර හොණ්ඩර 24 ට අඩු ස්වෛෂන්වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම.(බඳවා ගන්නා දිනට වසර තුනක (03) ට පෙර අවම වශයෙන් 'සී' සහ 'සී1' වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව 'බී' පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතුය.)

  ii. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය.

බර වාහන රියදුරු තනතුර සඳහා -

  i. තාර බර හොන්ඩර 34 දක්වා වන සැහැල්ලු ලොරි සහ මගීන් 32 ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස්රථ සඳහා රියදුරු බලපත්‍රයක් එනම්, 'ඒ1' සහ 'සී1' පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව 'බී' සහ 'ඩී1' පන්තියේ බලපත්‍රයක් නැතහොත් තාර බර හොන්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32 ට වඩා ගෙන යා හැකි බලපත්‍ර ලබා ඇති බස්රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද නිපුණතාව පිළිබඳ සහතිකයක් හෝ 'ඒ' පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව 'ඩී' පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතුය.



Scanned with CamScanner

04. **<u>බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ආරක්ෂක නියාමක III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම.</u>**

- වැටුප් ක්‍රමය :- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව PL 2 – 2025 (I වන වැටුප් පියවර ආරම්භක වැටුප වේ.)

41 800– 10 x 490 – 10 x 540 – 10 x 590 – 12 x 630 - 65560/-

(වැටුප් ගෙවනු ලබන්නේ උපලේඛන III හි සඳහන් පරිදි වේ.)

| තනතුර | වයස | අධ්‍යාපන සුදුසුකම් | කායික සුදුසුකම් | බඳවා ගන්නා ක්‍රමය | විභාග ගාස්තු |
|---|---|---|---|---|---|
| ආරක්ෂක නියාමක | අවුරුදු 18ට නොඅඩු 45ට නොවැඩි | අ.පො.ස.(සා/පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02) සහිතව විෂය න් හයක් (06) සමත් වී තිබීම. | සෑම අපේක්ෂකයෙක්ම කොළඹ නාගරික බල ප්‍රදේශය තුළ සේවය කිරීමටත් තනතුරට අදාළ රාජකාරි කටයුතු ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත වීම. (පිරිමි නියාමකයින් උස අඩි 5' 3" නොඅඩු වීම හා හුස්ම හෙලූ විට පපුව අඟල් 32 කට නොඅඩු වීම. කාන්තා නියාමකයින් සඳහා අඩි 5' 2" නොඅඩු වීම.) | ලිඛිත විභාගයේ කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට කැඳවා අදාළ අයදුම්කරුවන් ලිඛිත විභාගයේ ගන්නා ලද ලකුණු හා ව්‍යුහගත පරීක්ෂණයෙන් ලබා ගන්නා ලද මුළු ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීම සිදු කරනු ලැබේ. | රු. 500/- (ගෙවිය යුතු ආකාරය අයදුම්පතේ දක්වා ඇත.) |

❖ **විභාගය සඳහා වන විෂය නිර්දේශය :**

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය | කාලය |
|---|---|---|
| සාමාන්‍ය දැනුම | ජාතික කලාපිය සහ ලෝකයේ විවිධ සංවිධාන පරිසරයන් තුල පවතින සාමාජික, සංස්කෘතික, අධ්‍යාපනික විද්‍යාත්මක දේශපාලනමය ආර්ථික හා අනෙකුත් අදාළ සාධකයන් සම්බන්ධ ඇගයීමේ ප්‍රශ්න පත්‍රයකි. | පැය 01 |
| බුද්ධි පරීක්ෂණය | සාමාන්‍ය බුද්ධිය හා තර්කන ශක්තිය මැන බැලීම සඳහා ගණිතමය ගැටලු ඇතුළත් ප්‍රශ්න පත්‍රයකි. | පැය 01 |

❖ **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :-** ඉහත සඳහන් අයදුම්කරුවන් අතුරින් උස හා පපුව පිළිබඳ යෝග්‍යතා පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන්නන් පමණක් ව්‍යුහගත පරීක්ෂණයට භාජනය කෙරේ.



Scanned with CamScanner

## අයදුම්පත් යොමු කල යුතු ආකාරය

1. අයදුම්කරුවන් කොළඹ මහා නගර සභාවේ https://www.colombo.mc.gov.lk/news.php වෙබ් අඩවියේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4 ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තෙහිම යතුරු ලියනය කොට හෝ පැහැදිලි අත් අකුරින් පිළියෙළ කරගත් අයදුම්පතක් **"නාගරික කොමසාරිස්, නාගරික කොමසාරිස් කාර්යාලය, කොළඹ මහා නගර සභාව, පුරහල, කොළඹ 07"** යන ලිපිනයට 2026.08.10 වන දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුරු නාමය සඳහන් කළ යුතුය. 2026.08.10 වන දිනට පසුව ලැබෙන හා අතින් ගෙනවිත් භාර දෙන අයදුම්පත් සලකා බලනු නොලැබේ.

2.

| තනතුරු නාමය | අයදුම්පත්‍රයේ ආකෘතිය |
|---|---|
| • කාර්යාල සේවක සේවයේ (කාර්යාල කාර්ය සහයක)<br>• වැඩ/ ක්ෂේත්‍ර කම්කරු<br>• ගස් කපන්නා<br>• උපස්ථායක<br>• සුසානභූමි භාරකරු<br>• රසායනාගාර සේවක (සහයක)<br>• බල්ලන් අල්ලන්නා<br>• ක්ෂේත්‍ර කාර්යය සහයක | ආකෘති පත්‍ර අංක 01<br>(https://www.colombo.mc.gov.lk/news.php) |
| • ක්‍රීඩා උපදේශක | ආකෘති පත්‍ර අංක 02<br>(https://www.colombo.mc.gov.lk/news.php) |
| • මෝටර් රථ රියදුරු | ආකෘති පත්‍ර අංක 03<br>(https://www.colombo.mc.gov.lk/news.php) |
| • ආරක්ෂක නියාමක | ආකෘති පත්‍ර අංක 04<br>(https://www.colombo.mc.gov.lk/news.php) |

3. තනතුරු එකකට වඩා ඉල්ලුම් කරන්නේ නම් එක් එක් තනතුරු සඳහා වෙන වෙනම අයදුම්පත්‍ර ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කල යුතු වේ.

4. ඉහත තනතුරු සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය නාගරික කොමසාරිස් සතු වේ.

ඒ.ඩී.එස්. රෝහණ
නාගරික කොමසාරිස් (රා.ඉ.)
කොළඹ මහා නගර සභාව
2026.07. 20 වන දින

ඒ. ඩී. එස්. රෝහණ
නාගරික කොමසාරිස් (රා.ඉ.)
කොළඹ මහා නගර සභාව

නාගරික කොමසාරිස් කාර්යාලය,
කොළඹ මහා නගර සභාව,
පුරහල, කොළඹ 07.



Scanned with CamScanner